ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,210—1960 ඔක්තෝබර් 7 වැනි සිකුරාදා—7.10.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාණ්ඩවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

පිට
විභාග, විභාග ප්‍රතිඵල ආදිය 753
ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් 753
තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... 758
බඩු බාහිරාදිය විකිණීම 758

පිට
තොවුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... —
ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... —
රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... —
වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... —
විවිධ දැන්වීම් 759

විභාග, විභාග ප්‍රතිඵල ආදිය

රාජකීය විද්‍යාලයය

ශිෂ්‍යයන් ඇතුළත් කිරීමේ පරීක්ෂණය—1961

1961 ජනවාරි මාසයේ හයවෙනි පංක්තියට පිරිමි ළමයින් ඇතුලත් කර ගැනීමේ විභාගයක් 1960 නොවැම්බර මස 12 වෙනි සෙනසුරාදා රාජකීය විද්‍යාලයේදී පවත්වනු ලැබේ.

ශිෂ්‍යයන් පස්වෙනි ප්‍රමාණයේ දැනුම ලබා තිබිය යුතුයි. 1961 ජනවාරි මස 1 වෙනිදාට වයස අවුරුදු 10 කුත් මාස 6 ටත්, අවුරුදු 11 කුත් මාස 6 ටත් අතර වයස ඇත්තන් විය යුතුයි. විද්‍යාලයාධිපති තුමාගේ විශෙෂ තීරණයක් පිට පමණක් ඉහතින් සඳහන් වූවාට වඩා වයසින් අඩු ශිෂ්‍යයන්ට විභාගයට පෙණී සිටීමට අවසර දෙනු ලැබේ.

නියමිත අදුයම් පතක් විද්‍යාලයේ රෙජිස්ත්‍රාර් තැනගෙන් ලබා ගෙන එය පුරවා 1960 ඔක්තෝම්බර මස 28 වෙනි දිනට හෝ ඊට පෙර විද්‍යාලයාධිපති තුමා වෙත එවිය යුතුයි.

මෙම විභාගය සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තර කොළඹ 7 හී, රාජකීය විද්‍යාලයේ රෙජිස්ත්‍රාර් තැනගෙන් දැනගත හැකිය.

මෙම විභාගය සම්බන්ධයෙන් කිසිම ලියවිල්ලක් පෞද්ගලිකව විද්‍යාලයාධිපති නමට නො එවිය යුතුයි.

ඩබ්ලි කේ. ජී. ද සිල්වා,
විද්‍යාලයාධිපති, රාජකීය විද්‍යාලය.

කොළඹ 7, 1960 සැප්තැම්බර 27.

10-8

ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ත්‍රිකුණාමලේ වාරිමාර්ග දිස්ත්‍රික් ඉංජිනේරු තැන විසින් කන්තලේ ව්‍යාපාරයට පොල් අතු 1,00,000 ක් සැපයීම සඳහා එම දෙපාර්තමේන්තුවේ රුපියල් 10,000 ට හෝ ඊට වැඩි මුදලකට රෙජිස්ටර්වූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960.10.25 දින දවල් 10 ට ටැන්ඩර් බාරගනු ලැබේ.

ටැන්ඩර් පත්‍රිකා 1960.10.10 දින සිට 1960.10.22 දින දක්වා (ඉරිදා සහ ආණ්ඩුවේ නිවාඩු දවස් හැර) කන්තලේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක. ඒ සඳහා රුපියල් 25 ක මුදලක් තැන්පත් කළ යුතුයි.

විස්තර සඳහා එතුමාගෙන් විමසන්න.

කන්තලේ වාරිමාර්ග ඉංජිනේරු තැන.

10-70

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තංගල්ලේ දක්ෂිණ කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් 1960 නොවැම්බර් මස 8 වෙනි දින පෙරවරු 10 දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඇඹිලිපිටිය උපකොට්ඨාශයේ හුලංදා ඔය ජලාශව්‍යාපාරයේ පහත සඳහන් කොන්ත්‍රාත් වැඩ සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවේ පහත දැක්වෙන ගණන් වලට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් භාර ගනු ලැබේ:—

වැඩ පිළිබඳ විස්තර	ලියාපදිංචි වියයුතු මුදල රු.	ශ.		ටෙන්ඩර් තැන්පත් මුදල රු.	ශ.
හුලංදඹය ජලාශව්‍යාපාරයේ "ට්‍රැක්ට්" 4 දරණ කොට්ටයේ පහත සඳහන් වැඩ සඳහා—					
"යුනිට්.—ඩී"	29,000	0	...	50	0
"යුනිට්.—ඊ"	35,000	0	...	50	0
"යුනිට්.—එෆ්"	24,000	0	...	25	0
"යුනිට්.—ජී"	29,000	0	...	50	0
"යුනිට්.—එච්"	31,000	0	...	50	0
"යුනිට්.—ජේ"	26,000	0	...	50	0
"යුනිට්.—එම්"	16,000	0	...	25	0

2. ඇඹිලිපිටිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් පෝර්මවල එක වැඩක් සඳහා ටෙන්ඩර් දෙකු බැගින් ඉදිරිපත් කළ යුතුයි.

3. 1960 නොවැම්බර් මස 1 වෙනි දින සිට 3 වෙනි දින දක්වා (දෙදිනම ඇතුළුව අවසාන දින පමණක් පස්වරු 3 දක්වා) කාර්‍යාල වේලාවල් තුළදී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීම සඳහා ඉහත සඳහන් එක වැඩක් හෝ වැඩ කීපයක් පිණිස අවශ්‍ය තැන්පත් මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබා ගත් කුවිතාන්සියද ලියා පදිංචි කරන ලද පොතද ඉදිරිපත් කළ යුතුයි. දැනට රජයේ කොන්ත්‍රාත් ලබා තිබෙන අය එම වැඩ භාර නිලධාරීන්ගෙන් එම වැඩය හෝ වැඩ සතුටුදායක ලෙසට කරගෙන යන බවට සහ දැනට ආණ්ඩුව යටතේ තිබෙන වැඩ ප්‍රමාණය ගැනද සහතික ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සම්පූර්ණයෙන් රජය සතුය.

ඇම්. ජේ. ඇෆ්. ආර්. සේනාරත්න,
ඇඹිලිපිටිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග
ඉංජිනේරු තැන.

වාරිමාර්ග කාර්‍යාලය,
ඇඹිලිපිටිය,
1960. 9. 28.

9700

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තැන විසින් පහත දැක්වෙන සේවාවන් සඳහා වර්ෂ 1960 ක්වූ ඔක්තෝබර් මස 26 වෙනි බදාදා පෙරවරු 10 වන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ :—

(අ) 1960-61 වර්ෂයට මහකනදරාව වාරිමාර්ග උප කොට්ඨාශයේ බඩු බාහිරාදිය ගෙන යෑම—ටෙන්ඩර් අංක එම්. කේ. එල්. 13.

(ආ) 1960-61 වර්ෂයට මහකනදරාව වාරිමාර්ග උප කොට්ඨාශයට පොල් අතු සැපයීම—ටෙන්ඩර් අංක එම්. කේ. එල්. 14.

2. මෙම දෙපාර්තමේන්තුවේ රු. 20,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් ටැන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති.

3. සෑම ටෙන්ඩර් කරුවකු විසින්ම ටෙන්ඩර් පෝර්ම කොල දෙක බැගින් පූරවා ඉදිරිපත් කල යුතුය. මේ සඳහා පෝර්ම කොල සහ සියලු විස්තර මහකනදරාව වාරිමාර්ග ඉන්ජිනේරු තුමාගෙන් ලබා ගත හැකිය.

4. ටෙන්ඩර් පෝර්ම දෙනු ලබන්නේ කච්චේරියක හෝ මිහින්තලේ වාරිමාර්ග කාර්‍යාලයේ මුදලින් රු. 25ක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කරන මෙම දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවනට පමණී. 1960 ඔක්තෝබර් මස 10 වෙනි සඳුදා සිට 21 වෙනි සිකුරාදා දක්වා පෝර්ම කොල නිකුත් කරණු ලැබේ.

5. දැනට රජයේ කොන්ත්‍රාත් වැඩ කරන ටෙන්ඩර්කරුවන් ඒ වැඩ භාර නිලධාරීන්ගෙන් සතුටුදායක වැඩ සම්බන්ධයෙන් සහතික ඉදිරිපත් කල යුතුය.

6. සියලුම ටෙන්ඩර්කරුවෙක්ම තමන්ගේ වාහන වලින්ම කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට බැඳී සිටිය යුතුය.

7. ටෙන්ඩර් කැඳවීම නවත් වන දින උතුරු මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තුමා විසින් ඒවා විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවනට පැමිණ සිටිය හැක.

වාරිමාර්ග ඉන්ජිනේරු තැන්,
මහකනදරාව.

1960 සැප්තැම්බර් මස 10 වැනි දින,
මිහින්තලේ.

9646

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් කාර්‍යය සඳහා ටෙන්ඩර් පත්‍ර 1960. 10. 25 දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

1960-61 මාස්කන්නයේ මුරුන්කන් රජයේ ගොවිපලේ ගොයම් පැළ උදුරා සිටුවීම—අක්කර 50 (විස්තර) :—

(1) පැළ සති 4 ක් වීමට පෙර තවාන්වලින් හානි නොවන සේ පැළ උදුරා—

(2) කුඹුර කරා ගෙන ගොස් 5-6"ක් පරතරය සිටින සේ ත් අඟලක් යටවන සේ ත් එක් වලක පැළ 2-3 දක්වා සිටුවීම.

පැළ උදුරා පැය 24ක් ඇතුළත සිටුවිය යුතුයි. 1960 දෙසැම්බර් 15 වනදාට පෙර පැළ සිටුවීම සම්පූර්ණ කළ යුතුයි. දිනකට අඩු වශයෙන් අක්කර 4 කවත් පැළ සිටුවිය යුතුයි. එසේම මෙම වැඩය කළ යුත්තේ මුරුන්කන් ගොවිපලේ කළමනාකරු හෝ ඔහුගේ නියෝජිතයා සම්පූර්ණ සෑහීමට පත්වන අයුරු ඔහු විසින් නියම කරණ කාලය ඇතුළතදීය.

මිල ගණන් සඳහන් කළ යුත්තේ අක්කරයකටය. තවද පිළිගත් කොන්ත්‍රාත්කරු සම්පූර්ණ වපසරිය හෝ කොටසක් පිළිගැනීමට සූදානම් විය යුතුයි.

2. මන්නාරම කෘෂිකර්ම කාර්යාලයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් සහිතව ලියුම් කවරයක බහා, සීල් තබා "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙළවරෙහි" මුරුන්කන් ගොවිපලේ ගොයම් පැළ සිටුවීම සඳහා ටෙන්ඩර් යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 10 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 7 ක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ටද ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නො එවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් ලිපිකරු තැනට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "මුරුන්කන් ගොවිපලේ ගොයම් පැළ සිටුවීම සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළ හොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද, පිළිගනු ලැබුවාවූද දේවල මුළු ගණනින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමාගේ නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කර නිමවූ විට පමණකි. පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 3 කටවත් වෙනස් නොවන සථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනු ලැබේ.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කාර්ය සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචයේ අර්ථය නම්, පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

13. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

14. වර්ෂ 1934 ජේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු විසින් හෝ සේවකයෙකු වෙනුවෙන් හෝ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකම් අධ්‍යක්ෂ තුමා විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නො ලැබේ.

17. වැඩි විස්තර මන්නාරම දිස්ත්‍රික් කෘෂිකම් ව්‍යාප්ති නිලධාරි තැනගෙන් දැනගත හැක.

ඒ. වී. රිචඩ්ස්,
කෘෂිකම් අධ්‍යක්ෂ.

දිනය: 1960. 9. 28,
පේරාදෙණියේ දී ය.

9701

කෘෂිකම් දෙපාර්තමේන්තුව

ගොවිපලවලට රසායනික පෝර වර්ග සැපයීම—1960-61

පේරාදෙණියේ කෘෂිකම් දෙපාර්තමේන්තුවට අයත් රජයේ ගව මධ්‍යස්ථාන සහ කෘෂිකම් ගොවිපලවලට පහත සඳහන් රසායනික පෝර වර්ග සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ, ගාලු මුව දොර මහලේකම් කාර්යාලයේ පිහිටි කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 ඔක්තෝබර් මස 28 වැනි දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ. රේගු ගාස්තු සහිතව මුළු බර ප්‍රමාණය අනුව පෝර ටොන් එකකට අය කරන මිළ ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කළ යුතුයි.

රසායනික පෝර වර්ග	උවමනා කරන සාමාන්‍ය ප්‍රමාණය ටොන්
ඇමෝනියම් සල්ෆේට් ...	473
සුපර් ෆොස්ෆේට් (සාන්ද්‍ර) ...	86
පොටෑෂ් සල්ෆේට් ...	15
සැෆෝස් ෆොස්ෆේට් ...	170
පොටෑෂ් මියුරියේට් (60% ශ්‍රේණිය)	88
පොටෑසියම් නයිට්‍රේට් ...	3½
ඇමොෆොස් ...	හො. 3
ලේ පෝර ...	හො. 10
බේසික් ස්ලැග් ...	ටොන් 43
විෂ බීජ නසන ලද කටු පෝර ...	හො. 11
යූරියා	8
කැල්සියම් සයනමයිඩ් ...	22
ඇමෝනියම් නයිට්‍රේට් ...	5
නයිට්‍රෝචෝක් ...	හො. 3
මැග්නීසියම් සල්ෆේට් ...	1

2. මෙම පෝර අවශ්‍ය වන්නේ 1960 දෙසැම්බර් 1 වන දා සිට 1961 සැප්තැම්බර් 30 වන දා දක්වා වූ කාලයට ය.

3. රසායනික පෝර වර්ග පහත දැක්වෙන අඩුම පෝෂණ ගුන අඩංගු විය යුතුවාත් මෙන්ම උපද්‍රවදායක ද්‍රව්‍යයන්ගෙන් තොර විය යුතුයි. එක් එක් රසායනික පෝර වර්ගයේ අඩුම පොෂණ ගුණ අඩංගුතාවය ටෙන්ඩර් පත්‍රයේ පැහැදිලි ලෙස සඳහන් කළ යුතුයි.

රසායනික පෝර වර්ග	අඩුම විග්‍රහය
ඇමෝනියම් සල්ෆේට් ...	නයිට්‍රජන් සියයට 20.6 සි.
සුපර් ෆොස්ෆේට් (සාන්ද්‍ර) ...	පී$_2$ ඕ$_5$ සියයට 43.0 ක් තිබිය යුතුයි.
පොටෑෂ් සල්ෆේට් ...	කේ$_2$ ඕ සියයට 48.0 සි.
සැෆෝස් ෆොස්ෆේට් ...	පී$_2$ ඕ$_5$ සියයට 28.5 සි.
පොටෑෂ් මියුරියේට් (60% ශ්‍රේණිය)	කේ$_2$ ඕ සියයට 60.0 සි.
පොටෑසියම් නයිට්‍රේට් ...	ඇන් සියයට 14 සි. කේ$_2$ ඕ සියයට 44 සි.
ඇමොෆොස් ...	නයිට්‍රජන් සියයට 20.0 සි. පී$_2$ ඕ$_5$ සියයට 35.0 සි.
ලේ පෝර	නයිට්‍රජන් සියයට 10.0 සි.
බේසික් ස්ලැග් ...	පී$_2$ ඕ$_5$ සියයට 18.0 සි.
විෂ බීජ නසන ලද කටු පෝර ...	නයිට්‍රජන් සියයට 3.0 සි. පී$_2$ ඕ$_5$ සියයට 22.0 සි.
යූරියා	නයිට්‍රජන් සියයට 46.0 සි.
ඇමෝනියම් නයිට්‍රේට් ...	ඇන් සියයට 34.5 සි.
නයිට්‍රෝචෝක් ...	ඇන් සියයට 15.0 සි.
මැග්නීසියම් සල්ෆේට් ...	ඇම්.ජී.ඕ. සියයට 24.0 සි.
කැල්සියම් සයනමයිඩ් ...	නයිට්‍රජන් සියයට 20 සි.

4. පේරාදෙණියේ නියෝජ්‍ය කෘෂිකම් අධ්‍යක්ෂ තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සිල් තබා, "සභාපති මහතා, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිය අමාත්‍යාංශය, ගාලු මුවදොර, මහා ලේකම් කාර්යාලය, කොළඹ" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි "රසායනික පෝර වර්ග සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා එවිය යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිය අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ දැමිය යුතුය. එසේ නැති නම් රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නො එවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට බලය ඇති නිලධාරියා වන කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිය අමාත්‍යාංශයේ සහකාර ලේකම් මහතාට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "රසායනික පෝර වර්ග සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

රිජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින 4 ක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු කොළඹ, ගාලුමුවදොර මහාලේකම් කාර්යාලයේ කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුය.

6. ටෙන්ඩර් කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත, යටකී දිනයේ යටකී වේලාවේදී කොළඹ, ගාලු මුවදොර, මහා ලේකම් කාර්යාලයේ කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිය අමාත්‍යාංශයේදී ඒවා විවෘත කරනු ලැබේ.

7. 1960 ඔක්තෝබර් මස 27 දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 100 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බැව් දන්වා දස දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ටද ඉඩ තිබේ.

8. නියමිත පෝරමයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළ හොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ. ටෙන්ඩරය සම්බන්ධයෙන් ඉල්ලන මුදල් ගණන අකුරෙනුත් ඉලක්කමෙනුත් ලිවිය යුතුය. ඉලක්කමෙන් ලියන ලද ගණන අකුරෙන් ලියන ලද ගණනට වෙනස්වුවහොත් ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

9. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් කළ යුතුයි.

10. රසායනික පෝර වර්ග යවන අවස්ථාවේදී ඒවායින් සැම්පලයක් පරීක්ෂණයකට භාජන කරවීමට පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා බැඳී සිටිය යුතුයි. කෘෂිකම් අධ්‍යක්ෂ තැන විසින් නම් කරන ලද නිලධාරියෙකුට පරීක්ෂා කර බැලීම සඳහා ඒවායින් සැම්පල ගැනීමට ඔහු විසින් පහසුකම් සැලැස්විය යුතුයි. මේ සැම්පල් නියම තත්ත්වයකට නොතිබුණොත් සපයන ලද රසායනික පෝර තොග ටෙන්ඩර් කරුවාට දුම්රිය ගාස්තුව ගෙවා භාරගැනීමට ආපසු එවනු ලැබේ.

11. පළමුවෙනි ඡේදයෙහි සඳහන් රසායනික පෝර වර්ග සියල්ල හෝ එකක් හෝ වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර එවීමට ටෙන්ඩර් කරුවන්ට බලය තිබේ.

12. උවමනා වන විටත්, උවමනා වන හැටියටත් මේ රසායනික පෝර සැපයීමට ටෙන්ඩර් කරුවන්ට පුළුවන් විය යුතුයි. මේ තොග සැපයිය යුතු පිළිවෙල තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට කෘෂිකම්

අධ්‍යක්ෂ තැන විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් කලින් කළ දන්වනු ලැබේ. එසේ දන්වන විට එක් එක් පෝර තොග යැවිය යුතු ළඟම දුම්රිය පොළද සඳහන් කරනවා ඇත.

13. ටෙන්ඩරය පිළිගෙන දින 30 ක් ඇතුළතදී රසායනික ද්‍රව්‍ය සැපයිය යුතුය. මෙසේ සැපයිය නොහැකිවුවහොත් සතියකට රු. 25 බැගින් කොන්ත්‍රාත්කරු විසින් අලාභයක් ගෙවිය යුතුයි.

14. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් කරන මිළ ගණන් කොළඹදී දුම්රිය පෙට්ටි වල පටවන මුළු බර ප්‍රමාණය අනුව විය යුතුයි. පැටවුම් ගාස්තු දෙපාර්තමේන්තුවෙන් ගෙවනු නොලැබේ. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට තමාගේ ගබඩාවත්, බඩු එවන දුම්රිය ස්ථානයත් අතර රසායනික පෝර වර්ග ගෙන යෑමට යන ගමන් වියදම් දරන්ට සිදුවේ.

15. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිළිගනු ලැබුවාවූද රසායනික පෝරවලට යන මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකම් අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණකි. පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවා ද ඇත.

16. පොරොන්නු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ගෙවිය යුතුයි.

17. ඉහත සඳහන් රසායනික පෝර තොගය සපයා දෙන ලෙස නියම කිරීමට කෘෂිකම් අධක්ෂ තැන ඇප නොවේ. එසේම යම් කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමෙන් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගෙන උවමනා ප්‍රමාණයන් සපයා දෙන ලෙස නියම කිරීමේත් බලය ඔහු වෙත තබා ගනී.

18. කොන්ත්‍රාත්කරුවා විසින් එක් එක් ගොවිපලට යවන එක් එක් රසායනික පෝර තොගයකට බිල බැගින් නොයවා එක නොවි පලකට මාසයක් තුළදී සපයන ලද තොග සියල්ලටම එක බිලක් මාසය අවසානයේදී යැවිය යුතුයි.

19. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා රසායනික පෝර තබාගන්නා ගබඩාව වසංගත රෝග බෝකරන මැස්සන්ගෙන් තොරව ඉතා කිරිසුදු තත්ත්වයක තබා කත යුතුයි.

20. පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම පිණිස ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. ඒ වැඩය කිරීමට ලාංකික කම්කරුවන් යෙදවිය යුතු බව කොන්ත්‍රාත්තුවේ කොන්දේසියක් හැටියට සලකනු ලැබේ. පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්දේසිය ඉටු නොකළහොත් එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් කොට සලකනු ලැබේ. එපමණක්ද නොව එයින් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමටද ඉඩ ඇති වේ. එකකුදු වුවත් විශෙෂ තත්ත්වයක් යටතේදී කෘෂිකම් අධ්‍යක්ෂ තැනට තමා ලියුමකින් කලින් අනුමත කළ අලාංකික කම්කරුවන් වැඩට ගැනීමට කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිය අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් මහතාගේ සම්මතය ඇතුව කොන්ත්‍රාත් කරුවාට අවසර දීමට බලය ඇත්තේ ය. එවැනි අවසරයක් නොමැතිව අලාංකික කම්කරුවන් වැඩට ගැනීම කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් කොට සලකනු ලැබේ. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු වූ තැනැත්තෙක් ය යන්නයි.

21. 1934 රේ 19 අංකය දරණ කම්කරු වන්දි ආඥාපණත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත් කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

22. කොන්ත්‍රාත් කරුවාට හාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහුගේ නියෝජිතයාට (සමාගමක් නම් ඒ සමාගමේ නියෝජිතයා හෝ ලේකම් තැන ඇතුළුවයි) දුන්නොත් නැතහොත් ඔහු කියා ඇති ඔහුගේ කන්තෝරුවට හෝ නිවසට හෝ තැපැලෙන් යැව්වොත් ඔහු අතටම හාරදුන්නා කොට සැලකිය යුතුයි. කොන්ත්‍රාත් කරුවා ඔහුගේ කන්තෝරුව හෝ නිවස හෝ වෙනස් කළහොත් ඒ බව වහාම කෘෂිකම් අධ්‍යක්ෂ තැනට දැන්විය යුතුයි.

ඔහු එසේ දන්වන තුරු ඒ සියලු ලියුම්, දැන්වීම් හෝ සෙසු ලිය කියවිලි පොරොන්දු පත්‍රයේ සඳහන් ලිපිනයට යැව්වොත් ඒ යැවීම සියලු කටයුතු සම්බන්ධයෙන් එවා සෑහෙන පමණ හොඳින් ඔහුට හාරදීමම කොට සැලකිය යුතුයි.

23. වැඩට ගැනීමට නුසුදුසු යැයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත් කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුවට තබා ගනු ලැබේ.

24. දෙපාර්තමේන්තුවේ යහපත සඳහා කෘෂිකම් අධ්‍යක්ෂ තැනට ඉහත සඳහන් රසායනික පෝර සියල්ලම මිලට නොගත යුතුයැයි පෙනී ගියහොත් එසේ මිලට නොගැනීම හේතුකොටගෙන ආණ්ඩුවෙන් වන්දි මුදලක් ගැනීමට බලයක් කොන්ත්‍රාත් කරුවාට නොලැබේ.

25. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත්වූ හෝ තමාට සැහේ යැයි පෙනී යන හේතු පිට කෘෂිකම් අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

26. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ඇප කරුවන් දෙදෙනෙකු සොයාගෙන ඔහුගේ වියදමින්ම ඔවුන් ලවා පොරොන්දු ඔප්පුවක් අත්සන් කරවා ගත යුතුයි.

27. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියළු මිළ ගණන් යටත්පිරිසෙයින් මාස 2 කටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

28. සපයන ලද රසායනික පෝර වර්ග සතුටුදායක නොවීමත්, කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නොකිරීමත් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකම් අධ්‍යක්ෂ තැනට තබා ගනු ලැබේ.

29. වැඩි විස්තර පේරාදෙණියේ, කෘෂිකම් නියෝජ්‍ය අධ්‍යක්ෂ තැනගෙන් දැනගත හැකිය. එසේ විස්තර අසා එවන ලියුම් පහත සඳහන් අයගේ පුද්ගලික නමට නොඑවිය යුතුයි.

ඒ. වී. රිචඩ්ස්,
වැඩබලන කෘෂිකම් අධ්‍යක්ෂ.

1960.9.28,
පේරාදෙණියේදී ය.

9702

ටෙන්ඩර දැන්වීමයි

කොළඹ—කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සහාපති විසින් කුඩාරම් හා ඊට අමතර උපකරණ සැපයීම සඳහා 1960 දෙසැම්බර් මස 6 වැනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් හාරගනු ලැබේ.

2. කොළඹ—මැනුම්-පති කාර්යාලයේ මැනුම්-පති තුමාගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍ර වල පිළියෙල කරගත් ටෙන්ඩර අනු පිටපතකුත් සමග එවිය යුතුයි. මේ පිළිබඳ සියලුම විස්තර හා තොරතුරු මැනුම්-පති තුමාගෙන් ලබාගත හැක.

3. කොළඹ—මැනුම්-පති කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක රුපියල් 100 ක මුදලක් තැන්පත් කළ බවට ලියවිල්ලක් මැනුම්-පති තුමාට ඉදිරිපත් කළ විට, 1960 දෙසැම්බර් මස 5 වැනි සඳුදා පස්වරු 3 දක්වා ටෙන්ඩර පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. විදේශීය ටෙන්ඩර කරුවන් සඳහා ඇති ටෙන්ඩර පත්‍ර, මුහුදින් එතර ඇති ලාංකික දූත මණ්ඩල වලින් ලබාගත හැක.

වී. රාසරත්නම්,
මැනුම්-පති.

මැනුම්-පති කාර්යාලය (ගබඩා අංශය)
කොළඹ—1960 ඔක්තෝබර් මස 1 වැනි දින.

10/31

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

ඩීසල් තෙලින් ක්‍රියා කෙරෙන මෝටර් ග්‍රේඩර්ස් 3ක් සැපයීම

1960 සැප්තැම්බර් මස 16 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ මාගේ 1960.9.6 දාතම දරණ දැන්වීම සම්බන්ධවයි.

ඩීසල් තෙලින් ක්‍රියා කෙරෙන මෝටර් ග්‍රේඩරිස් 3ක් සැපයීම සඳහා කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සහාපති විසින් කැඳවනු ලබන ටෙන්ඩරයේ කාලසීමාව පහත දැක්වෙන පරිදි දීර්ඝ කරනු ලැබේ:—

ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමේ දිනය: 1960.10.28.

ඉහත කී අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සහාපති තැන විසින්—

ටෙන්ඩර් හාරගැනීමේ අවසාන දිනය: 1960.11.1 දින පෙරවරු 10 දක්වා.

ටෙන්ඩර් විවෘත කිරීමේ දිනය: 1960.11.1 දින පස්වරු 2.30ට.

ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එච්ලන් චතුරශ්‍රය,
කොළඹ 1, 1960.9.30 දින.

10-62

කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1960 ඔක්තෝබර් මස 20 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට රුවල් මැසීමට ගන්තා නූල් හොණ්ඩර පහක් සපයා භාර දීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1960 ඔක්තෝබර් මස 20 වෙනි දින පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් කාර්‍යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 25ක මුදලක් වරාය කොමිෂන් කාර්‍යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබා ගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1960 ඔක්තෝබර් මස 18 වෙනි අඟහරුවාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඒ. ඇස්. කොහොඹන්වික්‍රම,
වරාය කොමසාරිස්.

1960 සැප්තැම්බර් මස 28 වෙනි දින,
කොළඹ, වරාය කොමිෂන් කාර්‍යාලයේදීය.

10/45

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

මොරටුව වේලෝනා රෙදි වියන මධ්‍යස්ථානයෙහි ගබඩාවක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හී පිහිටි ප්‍රවාහණය සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 ඔක්තෝබර් මස 26 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ දකුණු කොළඹ භාර ආ: වැ: දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 ඔක්තෝබර් මස 14 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ: වැ: දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 133,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන; නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් "
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඇ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ: වැ: දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාලයේ දීය,
1960.10.3.

10-94/1

පුත්තලමේ හෘදයාබාධ ආරෝග්‍යශාලාවේ 2, 4, 5 සහ 6 වෙනි වාට්ටුවල සහ විවෘත ගරාජයේ වහල අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 ඔක්තෝබර් මස 26 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. පුත්තලමේ ආ: වැ: දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 ඔක්තෝබර් මස 14 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ: වැ: දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 25,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනනය,
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් "
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඇ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ: වැ: දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාලයේ දීය,
1960.10.3.

10-94/2

කන්කසන්තුරේ රෝගෝපසම ස්ථානයට ජලය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 ඔක්තෝබර් මස 26 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. යාපනය ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 ඔක්තෝබර් මස 14 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ: වැ: දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 9,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් "
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඇ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ: වැ: දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාලයේ දීය,
1960.10.3.

10—94/3

ගාලු කච්චේරියේ වැසිකිලියක් හා නාන කාමරයක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 ඔක්තෝබර් මස 26 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. ගාල්ලේ අ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 ඔක්තෝබර් මස 14 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් අ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 7,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාලයේ දීය,
1960.10.3.

10—94/4

තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පදවිය ව්‍යාපාරය

1960 සැප්තැම්බර් මස 14 වන බුද දින අවසන්කරනලද, පී. ඇල්. 1 දරණ පදවිය ව්‍යාපාරයේ අටවන යායේ බෙදුම් ඇලවේලි පාරවලට බොරලු දැමීමේ ටෙන්ඩරය, කුරුණෑගල වල්පොල කන්දේ ආරියසිංහලාගේ සෝමපාල මහත්මයාට භාරදුන් බව මෙයින් දන්වමි.

වාරිමාර්ග කාර්යාලය,
පදවිය හංදිය,
1960 සැප්තැම්බර් මස 27 වන දිනදීය.

සී. සී. ටී. ප්‍රනාන්දු,
වාරිමාර්ග ඉංජිනේරුතැන.

9691

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

1960 සැප්තැම්බර මස ටෙන්ඩර් පිළිබඳ තීරණ

සේවය	ටෙන්ඩර්කරුගේ නම	සාර්ථකවූ ටෙන්ඩර් කරුවෝ	පිළිගත් ගාස්තු
වෝටර් බවුසර් 5ක් සැපයීම ...	1. සීමාසහිත බ්‍රවුන් සහ සමාගම ...	... සීමා සහිත කොලට්ස් සහ සමාගම	එකක් රු. 25,950 බැගින් රේගු ගාස්තුව රහිතව
	2. සීමාසහිත කොලට්ස් සහ සමාගම		
	3. සීමාසහිත වෝකර් සහ පුත්‍රයෝ සමාගම		
	4. සීමාසහිත කලම්බු ඒජන්සිස් සහ සමාගම		

ඇස්. නමසිවායම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

1960 සැප්තැම්බර 30 දින
10/28

බඩු බාහිරාදිය විකිණීම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

මොරටුවේ වේල්ස් කුමාර මාවතෙහි පිහිටි, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු ලී ගබඩාවේ තිබෙන කළුවර කොටන් 19ක් සහ ඉරාපු ලී (මිශ්‍ර) ලොට් 33ක් 1960වේ ඔක්තෝබර් මස 25 වෙනි අඟහරුවාදා උදේ 10ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර මොරටුවේ ලී ගබඩාව භාරකරුගෙන් දැනගත හැක.

ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු,
වන සංරක්ෂක.

තැ. පෙ. 509,
කිව් පාර, කොළඹ 2.

10-60

ප්‍රසිද්ධ ගස් වෙන්දේසියක්

මාතලේ දිස්ත්‍රික්කය

මාතලේ නැගෙනහිර පළාතේ ලග්ගල පල්ලේසිය කෝරලේ, කන්දපිටවල වසමේ කළුගඟ ගමේ පිහිටි හත්කොට අමුණ ව්‍යාපාරය තුළ කපා ඉවත්කළ යුතුව තිබෙන හා දැනට කපා බිම හෙලා ඇති බුරුත, මිල්ල, හුලන්හිත් ආදී වර්ගවලට අයත් ගස් සියයක් පමණ මාතලේ කච්චේරියේ දී 1960 ඔක්තෝබර් මස 15 වැනි දින පෙරවරු 10 ට පටන්ගෙන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. ඉහත සඳහන් ව්‍යාපාරය භාරව සිටින ඉඩම් පරීක්ෂකතැන සමු වී ගස් පරීක්ෂාකර බැලිය හැක.

ගැනුම්කරු විසින් වෙන්දේසියෙන් තීන්දුවන මුදල වෙන්දේසිය අවසානයේ දී සම්පූර්ණයෙන් ගෙවිය යුතුයි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර මාතලේ නැගෙනහිර පළාතේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් හෝ මාතලේ කච්චේරියෙන් දැනගත හැක.

ඇන්. ඩබ්ලිව්. එච්. බී. ගුණරත්න,
මාතලේ දිසාපති වෙනුවට.

1960 සැප්තැම්බර් මස 30 වැනි දින,
මාතලේ කච්චේරියේ දීය.

10-72

වෙන්දේසියේ විකිණීමයි

පාවිච්චියට නුසුදුසු, අත්පුටු, කැරම්ලැලි, හරිකන්, ලාම්පු, වැහි තොප්පි ආදිය ඇතුළු බඩු තොගයක් 1960 ඔක්තෝබර් 20 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 ට කොළඹ චාමර්ස් ධාන්‍යාගාරයේ සහකාර ආහාර පාලක තැනගේ කාර්යාලයේදී වෙන්දේසියේ විකුණනු ලැබේ. 1960 ඔක්තෝබර් 17 වෙනි දින සිට කාර්යාල වේලාවන්හිදී මේ බඩු පරීක්ෂාකර බැලිය හැකිය. වෙන්දේසියේ තීන්දුවූ පසු පැයක් ඇතුලත එම බඩුවල සම්පූර්ණ වටිනාකම ගෙවා එදිනම පස්වරු 4 ට පෙර එම බඩු ඉවත් කර ගත යුතුය. මේ ගැන තවත් විස්තර කොළඹ 11, චාමර්ස් ධාන්‍යාගාරයේ සහකාර ආහාර පාලක තැනගෙන් ලබාගත හැකිය.

කේ. ඇම්. බී. ජයනෙත්ති,
ආහාර කොමසාරිස්.

1960 සැප්තැම්බර් මස 30 වෙනි දින,
අංක 330 යූනියන් පෙදෙස,
කොළඹ 2.

10-95

විවිධ දන්වීම්

ජාතික නිවාස දෙපාර්තමේන්තුව

කුලියට සින්නවීමේ ක්‍රමයේ මධ්‍යම පංති නිවාස

කොළඹ නගර සභා සීමාව තුළ නුගගහවත්තේ තනා ඇති නිවාස සඳහා ලංකාවේ පුරවැසියන් ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. "ඒ" වර්ගයේ නිවාස සඳහා ඉල්ලුම් කරුවන්ගේ මාසික ආදායම සිය භාර්යාවගේ/පුරුෂයාගේ ආදායමත් සමග රුපියල් 1,000 කට නොඅඩු විය යුතු අතර "බී" වර්ගයේ නිවාස සඳහා මාසික ආදායම රුපියල් 600 ට නොඅඩු විය යුතුය. ඉල්ලුම් පත් පිළියෙල කළ යුත්තේ කොළඹ ජාතික නිවාස දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර වලය. 1960 ඔක්තෝබර් මස 28 වෙනි දින පස්වරු 4.30 වන තෙක් ඉල්ලුම් පත් භාර ගනු ලැබේ.

2. මෙම නිවාස විදුලි එළිය, වැසිකිළි කාණු ක්‍රමය සහ ජල පහසුකම් වලින් සමන්විතය. "ඒ" වර්ගයේ නිවාසයන් පිහිටා ඇත්තේ පර්චස් 40ක විශාලත්වයක් ඇති ඉඩම් කැබලි වලය. "බී" වර්ගයේ නිවාස පර්චස් 20-30 ටත් අතර විශාලත්වයක් ඇති ඉඩම් කැබලි වල පිහිටා ඇත.

3. කොළඹ පදිංචි හෝ රැකියාවෙහි නියුතු තමන් සතු හෝ සිය භාර්යාව/පුරුෂයා හෝ තමන් ගෙන් යැපෙන ළමයින් සතු හෝ පදිංචියට සුදුසු නිවාසයක් නොමැති අය පමණක් ඉල්ලුම් පත් එවීමට සුදුස්සෝ වෙත්.

4. ගෙවල් වල පදිංචිය සඳහා සුදුසු අය තෝරා ගනු ලබන්නේ ජාතික නිවාස කොමසාරිස් වරයා විසිනි. මොනම අයථා පෙළඹීමක් ඇති වුවහොත් එයම ඉල්ලුම් කරුවකු නුසුදුස්සකු වීමට හේතු වන්නේ ය. තේරීම කරනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. කුසපත් ඇදීමේ දිනය සහ ස්ථානය පුවත් පත් නිවේදනයකින් පසුව දන්වනු ලැබේ. කුසපත් ඇදීම ඉල්ලුම් කරුවන්ට නැරඹිය හැක.

5. කුලියට සින්නවීමේ ක්‍රමයට තෝරා ගනු ලැබූ ඉල්ලුම් කරුවන්ට අන්තිමේදී ගෙවල් ලබාදෙනු ලැබේ. "ඒ" වර්ගයේ ගෙයක් සඳහා මසකට ගෙවිය යුතු මුදල රුපියල් 410 ක් වන අතර "බී" වර්ගයේ ගෙයකට රුපියල් 237.50 ක් ගෙවිය යුතුවේ. පර්චස් 20 ඉඩම් කැබලි වල ඇති "බී" වර්ගයේ ගෙයක් සඳහා මසකට රුපියල් 195 ක් ගෙවිය යුතුවේ.

6. තෝරා ගනු ලැබූ සෑම ඉල්ලුම් කරුවකුම රුපියල් 5,000 ක් සහ මසක කුලිය "ඒ" වර්ගයේ ගෙයක් සඳහාද, රුපියල් 2,500 ක් සහ මසක කුලිය "බී" වර්ගයේ ගෙයක් සඳහාද තැන්පත් කළ යුතුය. මෙයට වඩා විශාල තැන්පත් මුදලක් ගෙවිය හැකි නම් ඊට විරුද්ධත්වයක් නොමැත. තමන්ට ගෙවිය හැකි තැන්පත් මුදල කොපමණ දැයිද, ඉල්ලුම් කරනුයේ කුමන වර්ගයේ ගෙයක්ද යනු ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

7. ගෙවල් අළුත්වැඩියා කිරීම සහ නඩත්තුව ඉල්ලුම්කරු විසින්ම කළ යුතුවා පමණක් නොව, ගින්නෙන් පැමිණිය හැකි අලාභයන් සඳහා (ඉන්ෂුවර්) කරවා ගැනීම සහ වරිපනම් ගෙවීම ආදියද තමන් විසින්ම කළ යුතුය. මෙම ගෙවල් ලබාගත් පසු අනුගමනය කළ යුතු දේ සම්බන්ධිත ගිවිසුමකට කොමසාරිස් තැන හා ඉල්ලුම් කරුවන් බැඳිය යුතුය.

8. ඉල්ලුම් පත එවා දින 21 ක් තුළදී එය ලැබුණු බවට දන්වීමක් නොලැබුනහොත් ඒ බැව් තැපැල් කාර්යාලයයේ ලියාපදිංචි කරන ලද ලිපියකින් මෙම දෙපාර්තමේන්තුවට දන්විය යුතුය. ඉල්ලුම් පත් බහා එවනු ලබන පිට කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "නුගගහවත්තේ ගෙවල් සඳහා ඉල්ලුම් පත්" යැයි සඳහන් කළ යුතුය.

ආර්. ඇල්. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

කොළඹ.

9687

ජාතික නිවාස දෙපාර්තමේන්තුව

බම්බලපිටියේ තට්ටු නිවාස භූමියෙහි තනා ඇති සාප්පු ගොඩනැගිල්ලක් කුලියට දීම

බම්බලපිටියේ තට්ටු නිවාස භූමියෙහි තනා ඇති අංක 3 දරණ සාප්පු ගොඩනැගිල්ල කුලියට දීම සඳහා 1960 ඔක්තෝබර් 29 වෙනිදා පෙරවරු 10ට කොළඹ පාර්සන්ස් පාරේ පිහිටි මගේ කාර්යාලයේදී වෙන්දේසියක් පැවැත්වේ.

මෙම සාප්පු ගොඩනැගිල්ලේ විශාලත්වය හතරැස් අඩි 675 කි. මාසික කුලිය රුපියල් 350 ක් වේ.

මෙම ගොඩනැගිල්ල සඳහා ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ හැකි අඩුම ලන්සුව රුපියල් 1,000 ක් වන අතර එම ගොඩනැගිල්ල සඳහා තර කළ හැක්කේ පහත සඳහන් ව්‍යාපාරය ගෙන යාමට සතුටු අයට පමණකි.

බාබර් සාප්පුවක් සඳහා :—මේ සඳහා අවසර දෙනුයේ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම පහසුකම් සැලසීමට එකඟව බඳු ගිවිසුමක් අත්සන් කළහොත් පමණි.

ඉහළම ගණනක ලන්සුව ඉදිරිපත් කරන තැනැත්තාට ගොඩනැගිල්ල කුලියට ගැනීමේ අයිතිය පවරනවා ඇත. ඉහත සඳහන් මූලික මුදලට අඩු ලන්සුවක් භාරගනු නොලැබේ.

සිය තීරණයට හේතු නොපෙන්වා ලන්සුවක් පිළිගැනීමේ හෝ නොපිළිගැනීමේ අයිතිය කොමසාරිස් තුමා කෙරෙහි තබා ගනු ලබනවාත් හැර ඔහුගේ එකී තීරණය අවසාන තීරණය වන්නේ ය.

තෝරා ගනු ලැබූ ඉල්ලුම්කරු ඔහුගේ ලන්සුව පිළිගත් වහාම ලන්සුවේ වටිනාකමින් සියයට 50 ක් සහ තුන් මසක කුලී ප්‍රමාණය තැන්පත් මුදලක් සේ කොමසාරිස් තුමාට ගෙවිය යුතුය. ඉතිරි මුදල සති දෙකක් තුළදී නොගෙව්වහොත්, තැන්පත් කරන ලද මුදල රාජසන්තක වේ. තැන්පත් කරන ලද ලන්සුවේ වටිනාකම ආපසු ගෙවනු නොලැබේ. තෝරාගනු ලැබූ ඉල්ලුම්කරු තමන්ගේ ලන්සුවේ වටිනාකම සහ තුන් මසක කුලී ගෙවූ පසු පහත සඳහන් කොන්දේසි අඩංගු ගෙවල් කුලී ගිවිසුමකට අත්සන් තැබිය යුතුය :—

(අ) ජාතික නිවාස කොමසාරිස් ගෙන් ලියවිල්ලකින් ලබාගත් අනුමැතිය නොමැතිව තෝරා ගත් ඉල්ලුම්කරු ගොඩනැගිල්ලේ පදිංචිකරුවන් වූ විට තමන්ට කුලියට දෙන ලද ගොඩනැගිල්ල වෙනත් අයකුට කුලියට දීම, විකිණීම, තෑගි කිරීම, උකස් කිරීම හෝ වෙනයම් විදියකින් ඔහුගේ අයිතිය අන් අයකුට පැවරීම නොකළ යුතුය ;

(ආ) තෝරාගත් ඉල්ලුම්කරු ගොඩනැගිල්ලේ පදිංචිකරුවූ විට එම ගොඩනැගිල්ල සිය වියදමෙන් අළුත්වැඩියා කොට සෑම අවස්ථාවේම යථා තත්ත්වයෙන් තබා ගත යුතුය. තමන්ට කුලියට දී ඇති ගොඩනැගිල්ල වටා තාප්පයක් හෝ වැටක් ඉදි කොට එය යථා තත්ත්වයේ තබා ගත යුතුය ;

(ඇ) තෝරාගත් ඉල්ලුම්කරු ගොඩනැගිල්ලේ පදිංචියට පැමිණි පසු ඔහුට පවරා ඇති පදිංචිය හමාර වූ විට එම ගොඩනැගිල්ල ඊට සවිකර ඇති සෑම දෙයක්ම මනා තත්ත්වයකින් අමතරව ඉදිකර ඇති ගොඩනැගිල්ල සහ වැඩි දියුණු කර ඇති කොටස්ද සමග ජාතික නිවාස කොමසාරිස් තැනට භාරදිය යුතුය. යම් අමතර කොටස් ඉදිකර ඇතොත් ඒ සඳහා කිසිම අලාභයක් පදිංචිකරුට ගෙවනු නොලැබේ ;

(ඈ) අවුරුදු පහකට වරක් අවශ්‍ය වුවහොත් ගෙවල් කුලී සංශෝධනය කරනු ලැබේ.

මේ සම්බන්ධ වැඩි විස්තර ජාතික නිවාස කොමසාරිස් තැන ගෙන් ලබා ගත හැක.

ආර්. ඇල්. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

කොළඹ 2.

9695

ජාතික නිවාස දෙපාර්තමේන්තුව

කෑගල්ල දිස්ත්‍රික්කයේ නිවාස යෝජනා ක්‍රම

කෑගල්ල දිස්ත්‍රික්කයේ රොක්හිල්වත්තේ සාදා ඇති කුලියට සින්නවීමේ ක්‍රමයට දිය හැකි අඩු කුලී ගෙවල් සඳහා ලංකාවේ පුරවැසියන් ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් ඉල්ලුම් පත් භාර ගනු ලැබේ :—

(අ) තමන්ගේ සහ තමන්ගේ භාර්යාව/පුරුෂයා ගේ සම්පූර්ණ මාසික ආදායම රුපියල් 200 ට නොවැඩි අය ;

(ආ) පහත සඳහන් ගම්මුලාදෑනි කොට්ඨාශවල ස්ථිරව පදිංචි හෝ රැකියාවෙහි නියුතු, තමන්ගේ නමින් හෝ තමන්ගේ භාර්යාවගේ/පුරුෂයාගේ නමින් හෝ තමන්ගෙන් යැපෙන ළමයෙකු නමින් හෝ ගෙයක් නොමැති අය ;

කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළේ ආදායම් පාලක නිලධාරි තුමාගේ කොට්ඨාශයට අයත් :

(1) සියඹලාපිටිය වසම,
(2) මාකුර වසම, සහ
(3) එකිරියාගල වසම.

2. සෑම ගෙයක්ම පිහිටා ඇත්තේ දළ වශයෙන් පර්චස් 15ක් පමණවූ ඉඩමකය. ගෙවල්වල වහල උළු සෙවිලි කර ඇති අතර බිම සිමෙන්තියෙන් සාදා ඇත. එක ගෙයකට ඉස්තෝප්පුවක්, කාමර දෙකක්, මුළුතැන් ගෙයක් සහ ජල මුද්‍රිත වැසිකිළියක් බැගින් තිබේ.

3. අවුරුදු 25කින් මුළු මුදල ගෙවී යන පරිදි ගෙයක කුලිය මසකට රුපියල් 23ක් පමණ වේ.

4. ගෙයි පදිංචිකාරයාට ගෙයි නීත්‍යානුකූල අයිතිය පැවරෙන්නේ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කළ විටය. ගෙයි පදිංචිකාරයා යම්කිසි අවස්ථාවකදී ශේෂව තිබෙන මුදල එකවිටම ගෙවා දැමීමත්

සමගම ගෙයි නීත්‍යානුකූල අයිතියක් ඔහුට පවරා දෙනු ලැබේ. ගෙයි පදිංචියට ගියදා සිට ගෙයි පදිංචිකාරයා විසින්ම ගෙය නඩත්තු කළ යුතුවා පමණක් නොව, ගෙවල් කුලියද, වරිපණම් හා වෙනත් ගාස්තුද ගෙවිය යුතුවේ.

5. ගෙවල්වල පදිංචිය සඳහා සුදුසු අය තෝරා ගනු ලබන්නේ ජාතික නිවාස කොමසාරිස් වරයා විසිනි.

6. කොළඹ, ජාතික නිවාස දෙපාර්තමේන්තුව මේ සඳහා පිළියෙල කර ඇති ඉල්ලුම් පත්‍ර මගින් ඉල්ලුම් කළ යුතු අතර එකී ඉල්ලුම් පත්‍ර 1960 ඔක්තෝබර් 28 වෙනි දිනට හෝ ඊට පෙර ජාතික නිවාස කොමසාරිස් තැන වෙත ලැබෙන සේ එවිය යුතුය. ඉල්ලුම් පත එවා දින 21ක් තුළදී එය ලැබුණු බවට දන්වීමක් නොලැබුණහොත් ඒ බැව් දන්වා තැපැල් කාර්යාලයයේ ලියාපදිංචි කරන ලද ලිපියකින් මෙම දෙපාර්තමේන්තුවට දන්විය යුතුය. ඉල්ලුම් පත් බහා එවනු ලබන පිට කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "කෑගල්ල දිස්ත්‍රික්කයේ ගෙවල් සඳහා ඉල්ලුම් පත්" යැයි සඳහන් කළ යුතුය.

ආර්. ඇල්. ආර්නෝල්ඩ්,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2.

10/51

විශේෂ නිවේදනයයි

1960 ඔක්තෝබර් 19 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1960 ඔක්තෝබර් 21 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1960 ඔක්තෝබර් 15 වැනි සෙනසුරාදා පස්වරු 12.30ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1960 සැප්තැම්බර් 27 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු

ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක** පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරන ගාස්තු මෙසේ යි :—

	රු.	ශ.
අඟලකට හෝ ඉන් අඩුව	10	0
වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට	5	0
තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට	60	0
තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට	120	0

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30ට **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

13. ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.

14. දායක මුදල් :—

		රු.	ශ.
වාර්ෂික දායක මුදල	එක් කාණ්ඩයක් සඳහා ...	15	0
	I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ...	7	0
සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට	... ...		25
	තැපැල් ගාස්තුවත් සමග ...		31
I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ...	... ...		10
	තැපැල් ගාස්තුවත් සමග ...		14

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.